දුම්රිය
புகையிரத
Railway } GMF 35

ඔබේ අංකය
உமது இல.
Your No. } ..............................

දුරකථන (දු.ස.)
தொலைபேசி (பொ.மு.)
Telephone (G.M.R.) } 2431177

E-mail : gmrslr@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office } 2421281

ෆැක්ස්
தொலைநகல்
Fax } 2446490

# ශ්‍රී ලංකා දුම්රිය සේවය
## இலங்கை புகையிரத சேவை
## SRI LANKA RAILWAYS

මගේ අංකය
எனது இல.
My No. } ම.ජ./එච්ධ/2025

සාමාන්‍යාධිකාරී කාර්යාලය,
තැ. පෙ. 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

பொது முகாமையாளர் அலுவலகம்,
த. பெ. 355, ஒல்கொட் மாவத்தை,
கொழும்பு 10.

General Manager's Office,
P. O. Box 355, Olcott Mawatha,
Colombo 10.

2025.03.03

අධ්‍යක්ෂ ජෙනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

**රාත්‍රී කාලයේ ධාවනය වන දුම්රියන්හි වන අලින් ගැටීම වැලැක්වීම සඳහා අමතර වේග සීමා ක්‍රියාත්මක කිරීම සහ දුම්රිය ආරම්භක වේලාවන් සංශෝධනය කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙනි.

රාත්‍රී කාලයේ ධාවනය වන දුම්රියන්හි වන අලින් ගැටීම වැලැක්වීම සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුව මේ වනවිට දීර්ඝ කාලීන මෙන්ම කෙටි කාලීන ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇති අතර එහි මූලික පියවරක් ලෙස වන අලින් බහුල ලෙස සැරිසැරීම පිලිබඳව වාර්තා වී ඇති ප්‍රදේශයන්හිදී දුම්රිය ධාවන වේගය අවම වන ලෙස එම කලාප සඳහා අඩු වේගසීමාවක් ලබාදී දුම්රිය කාලසටහන් සංශෝධනය කිරීමට සහ අදාළ ප්‍රදේශයන්හි වන අලින් සැරිසරන කාලසීමවන්හි දුම්රිය ධාවනය අවම වන ලෙස එම ප්‍රදේශයන් හරහා දුම්රිය ගමන් කිරීමේදී වන අලින් වැඩිවශයෙන් සැරිසරන කාලසීමාවන්ට පෙර සහ එම කාලසීමාවන්ට පසුව දුම්රිය ධාවනය කිරීම සඳහා දුම්රිය ආරම්භක වෙලාව සංශෝධනය කිරීමට මේ වන විට දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

ඒ අනුව මඩකලපුව මාර්ගයේ පලුගස්වැව සිට හිඟුරක්ගොඩ දක්වා සහ වැලිකන්ද සිට පුනානි දක්වා ද ත්‍රිකුණාමලය මාර්ගයේ ගල්ඔය හන්දිය සිට කන්තලේ දක්වා ප්‍රදේශය ආවරණය වන පරිදි මෙම දුම්රිය කාලසටහන් සංශෝධනය සිදුකර ඇති අතර එය 2025 මාර්තු 07 දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇත. තව ද මීට සමගාමීව එදින සිට කොළඹ කොටුව සහ මඩකලපුව අතර ධාවනය වන "මීනගයා" නගරාන්තර රාත්‍රී තැපැල් දුම්රිය සඳහා s-13 වර්ගයේ බලවේග කට්ටලයක් ධාවනයට යෙදවීම සඳහා ද සැලසුම් කර ඇත.

2025.03.07 දින සිට ඉදිරි දිනයන් සඳහා කලින් ආසන වෙන්කිරීම් සිදුකරන ලද මගීන් හට නියමිත පරිදි කල්වේලා ඇතිව අදාළ දුම්රියන් සඳහා පැමිණීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙන අතර මෙලෙස දුම්රිය ආරම්භක වේලාවන් සංශෝධනය කිරීම සහ ඉහත පරිදි වේගසීමා පැනවීම හේතුවෙන් ගමනාන්ත දුම්රිය ස්ථාන වෙත ලඟාවීමේදී අමතර කාලයක් ගත කිරීමට සිදුවීම සම්බන්ධයෙන් මගී ජනතාව වෙත දුම්රිය දෙපාර්තමේන්තුවේ කණගාටුව පළකර සිටින අතර වන අලින් සුරැකීම ජාතික වගකීමක් ලෙස සලකා දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු කරන බව තවදුරටත් ප්‍රකාශ කර සිටිමි.

2025.03.07 දින සිට සංශෝදිත දුම්රිය ආරම්භක සහ ගමනාන්ත වේලාවන් මේ සමග ඉදිරිපත් කර ඇති අතර මේ සම්බන්ධයෙන් ජනතාව වෙත පුළුල් ප්‍රචාරයක් ලබාදීමට කටයුතු කරන්නේ නම් මැනවි.

ඇමිණුම 01 යි.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන)

එන්. ජේ. ඉඳිපොලගේ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන) කාර්යාලය
දුම්රිය මූලස්ථානය
කොළඹ 10